# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2472/06 – 2026 ජනවාරි මස 20 වැනි අඟහරුවාදා – 2026.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය : IR/COM/04/2023/12.

**කාර්මික ආරාවුල් පනත – 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.07.21 දිනැති හා අංක 2446/32 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශේෂ* ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද 2025.07.03 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් වැල්ලවාය, යාලබෝව, සී/ස ලංකා සීනි සමාගම, නිල නිවාස සංකීර්ණය, නිවාස අංක 05 ලිපිනයෙහි පදිංචි ඒ.එම්. එස්.එම්.පී.එස්. අත්තනායක මහතා සහ බුත්තල, පෞද්ගලික තැපැල් මල්ල ලිපිනයෙහි පිහිටි සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A42/2025 හා 2025.11.20 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 ජනවාරි මස 12 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව

නඩු අංකය : A/42/2025
යොමු අංකය : IR/Com/04/2023/12

ඒ.එම්.එස්.එම්.පී.එස්. අත්තනායක මයා,
නිවාස අංක 05,
නිල නිවාස සංකීර්ණය,
සී/ස ලංකා සීනි සමාගම,
යාලබෝව, වැල්ලවාය.

*(පළමු පාර්ශ්වය)*

සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම,
පෞද්ගලික තැපැල් මල්ල,
බුත්තල.

*(දෙවන පාර්ශ්වය)*

අතර පවතින ආරාවුල

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4 (1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ආචාර්ය කේ.ඒ. තිලකරත්න වන මා පත්කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර, ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණු වනුයේ,

"සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගමෙහි සේවය කරන ඒ.එම්.එස්.එම්.පී.එස්. අත්තනායක මහතා 2021.03.05 දින වැඩ තහනම් කර පසුව 2022.05.03 වන දින නැවත සේවයෙහි පිහිටුවීමේ දී,

i. වැඩ මූලික තනතුර ජ්‍යෙෂ්ඨ විදුලි කාර්මික ලෙස පහත හෙළීම.
ii. 2022/2023/2024 වැටුප් වර්ධක විලම්භනය කිරීම.
iii. වැඩ තහනමට ලක් වූ කාලය සඳහා වැටුප් නොගෙවීම.
iv. අභ්‍යන්තර ස්ථාන මාරුවක් සිදු කිරීම.
v. ආයතනය විසින් පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයේ අවසන් වාර්තාවේ පිටපතක් ලබා නොදීම.

යන කරුණු මගින් අසාධාරණයක් සිදුව තිබේ ද යන්නත් එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහනයන් කවරේ ද කවර දා සිට ද යන්නත් පිළිබඳව වේ."

ඉහත කාර්මික ආරාවුලට අදාළව පූර්ව බේරුම්කරුවෙකු විසින් 2024.04.22, 2024.05.17, 2025.07.10, 2024.07.26, 2024.08.26, 2024.09.27, 2024.11.04 යන දිනවලදී පරීක්ෂණ කටයුතු මෙහෙයවා තිබේ. මෙම බේරුම්කරු 2025.03.19 දින ඉල්ලා අස්වූ බැවින් නව බේරුම්කරු වශයෙන් මා පත්කොට ඇත.

මෙම නඩු කෘත්‍යය යළිත් 2025.08.11, 2025.09.30 සහ 2025.10.21 දින විභාගයට ගනු ලැබූ අතර, පරීක්ෂණ කටයුතු සඳහා ඉතා දීර්ඝ කාලයක් ගතවීම යළි යළිත් සමථයක් සඳහා අවස්ථාව ලබාදීම, මූලික සාක්ෂි විමසා තිබීම හා හරස් ප්‍රශ්න විමසා තිබීම යන හේතු මත තවදුරටත් සාක්ෂි විමසීමකින් තොරව නඩු කටයුතු අවසන් කිරීමට දෙපාර්ශ්වයම එකඟ විය.

නඩුකරයට පාදක වූ කරුණු සම්පිණ්ඩනය පහත සඳහන් පරිදි වේ.

පැමිණිලිකරු හෙවත් ඒ.එම්.එස්.එම්.පී.එස්. අත්තනායක මහතා සී/ස පැලවත්ත සීනි (පුද්ගලික) සමාගමේ වැඩ මුලිකවරයෙකු වශයෙන් සේවය කොට ඇත. ඔහු සේවයේ යෙදී සිටියදී 2021.03.05 වන දින වර්ජනයකට හෝ විරෝධතාවයකට සේවකයන් යොමු කලාය යන කරුණු මත පාලන අධිකාරිය විසින් ඔහුගේ සේවය අත්හිටුවා චෝදනා පත්‍රයක් ලබාදී විනය පරීක්ෂණයක් පවත්වා ඇත. ඉන් පසුව 2022.05.03 දින සිට නැවත සේවයේ පිහිටුවා ඇත.

ඔහු යළි සේවයේ පිහිටුවීමේදී හිඟ වැටුප් රහිතව පහත සඳහන් දඬුවම්වලට යටත් කොට ඇත.

i. SI වැඩ මුලික ලෙස සේවයේ යෙදුන පැමිණිලිකරු ජ්‍යෙෂ්ඨ විදුලි කාර්මික දක්වා පහත හෙළීම.
ii. 2022, 2023 සහ 2024 වර්ෂ තුනට අදාළ වැටුප් වර්ධක විලම්භනය කිරීම.
iii. යළි සේවයේ පිහිටුවීමේදී පැලවත්ත විදුලි අංශයේ (කර්මාන්තශාලා විදුලි අංශයේ) සිට බාහිර විදුලි නඩත්තු අංශයට අනුයුක්ත කිරීම.
iv. තරයේ අවවාද කිරීම.

පැමිණිලිකරු වන අත්තනායක මහතා මෙම බේරුම්කරණ අධිකරණය තුළින් අයැද සිටින්නේ,

අසාධාරණ හා අයුක්ති සහගත ලෙස තමන්ට ලබාදී ඇති විනය නියෝගය හේතුවෙන් අහිමි වූ මූල්‍යමය අලාභය හා තනතුර අහිමි කිරීම යළි ලබාදෙන ලෙසයි.

පැමිණිලිකාර පාර්ශ්වය විසින් තමන්ට ලබාදුන් විනය නියෝගය අසාධාරණ හා අයුක්ති සහගත බව සනාථ කිරීමට පහත සඳහන් කරුණු ගරු බේරුම්කරණ අධිකරණය වෙත ඉදිරිපත් කොට ඇත.

1. පැමිණිලිකරුගේ වසර 35ක පූර්ව සේවා කාලය ඉතා යහපත් වීම.

2. තමන්ට එරෙහිව පවත්වන ලද මූලික විමර්ශනය පක්ෂග්‍රාහීව පැවැත්වීම හා විනය පරීක්ෂණය ස්වාභාවික යුක්ති මූලධර්මයන්ට පටහැනිව පැවැත්වීම හා එම පරීක්ෂණයේ තීන්දු මත හිමිකම් අහිමිකිරීම අසාධාරණ හා අයුක්ති සහගත වීම.

3. පැමිණිලිකරුගේ අනුදැනුමකින් තොරව, මෙහෙයවීමකින් පරිබාහිරව ආයතනයේ වෘත්තීය සේවක විරෝධතාවයක් හටගෙන ඇති අතර, එම සේවක විරෝධතාවය පාලනය කිරීමට පැමිණිලිකරුට හැකියාවක් නොතිබීම.

4. පැමිණිලිකරු එම විරෝධතාවයට සම්බන්ධ නොමැති අතර, එම විරෝධතාවයට සම්බන්ධ අනෙකුත් සේවකයන් කිසිදු සේවා කඩ වීමකින් තොරව වග උත්තරකාර ආයතනය යටතේ සේවයේ යොදවා තිබීම.

5. එම විරෝධතාවයට පැමිණිලිකරු සම්බන්ධ වෘත්තීය සමිතියේ සාමාජිකයන් පමණක් නොව අනෙකුත් වෘත්තීය සමිති සාමාජිකයන්ද, සහභාගී වී ඇති අතර, එහි ප්‍රමුඛත්වය ගෙන ක්‍රියාකර ඇත්තේ වෙනත් වෘත්තීය සමිතියක් වීම හා එම වෘත්තීය සමිති නායකයන් හා වෘත්තීය සමිති සාමාජිකයන් සේවයේ යෙදී සිටියදී ඉල්ලුම්කරුට පමණක් දඬුවම් පැමිණ වීම හිතාමතාම දේශපාලන පලිගැනීමක් වීම.

6. තමාට ලබාදුන් විනය නියෝගය ඉවත්කර ගැනීමට සාකච්ඡා කිරීමට හා ඒ සම්බන්ධයෙන් වග උත්තරකාර පාර්ශ්වයෙන් කිසිදු සහයෝගයක් නොලැබීම.

පැමිණිලිකරු වන ඒ.එම්.එස්.එම්.පී.එස්. අත්තනායක මහතා වෙත පනවනු ලැබූ විනය නියෝගය හා දඬුවම් සාධාරණ බව පෙන්නුම් කිරීමට වග උත්තරකාර පාර්ශ්වය හෙවත් සී/ස පැලවත්ත සීනි (පුද්ගලික) සමාගම ස්වකීය නීතිඥවරුන් මගින් පහත සඳහන් කරුණු ගරු බේරුම්කරණ අධිකරණය වෙත වාර්තා කර තිබුණි.

1. පැමිණිලිකරු SI අංශයේ වැඩ මුලිකවරයෙකු වශයෙන් සේවය කරමින් සිටියදී 2021.03.05 දින කිසිදු පූර්ව දැනුම්දීමකින් තොරව වැඩ වර්ජනයකට හෝ සේවක විරෝධතාවයකට යොමු කිරීම පිළිබඳව මූලික විමර්ශනයක් කර වැඩ තහනම් සිදුකිරීම.

2. මූලික විමර්ශනයේදී අනාවරණය වූ කරුණුවලට යටත්ව චෝදනා 06කින් යුක්ත චෝදනා පත්‍රයක් ලබාදීම.

3. විධිමත් විනය පරීක්ෂණයක් පැවැත්වීම හා චෝදනා 06ටම පැමිණිලිකරු වරදකරු බවට තීරණය වීම.

4. විධිමත් විනය පරීක්ෂණයේ නිර්දේශ ප්‍රකාරව පහත සඳහන් විනය නියෝගවලට යටත්ව දඬුවම් පැමිණවීම.

   - යළි සේවයේ පිහිටුවන දින සිට SI - වැඩ මූලික තත්ත්වයෙන් PI - ජොෂ්ඨ විදුලි කාර්මික ලෙස තනතුර පහත හෙළීම.
   - 2022,2023,2024 යන වර්ෂ 03ට අදාළ වැටුප් වර්ධක විලම්භනය කිරීම
   - යලි සේවයේ පිහිටුවන දින සිට කර්මාන්තශාලා විදුලි අංශයෙන් ස්කාගාරයේ බැහැර විදුලි නඩත්තු අංශයට අනුයුක්ත කිරීම.
   - තරයේ තරවටු කිරීම

5. මොනරාගල කම්කරු කාර්යාලයේ පැවති පරීක්ෂණයකින් අමතරව පැමිණිලිකරු වෙත 2021 පෙබරවාරි මස හා 2021 මාර්තු 04 වන දින දක්වා ගෙවීමට තිබූ අතිකාල සඳහා රු. 55,115.00ක (රුපියල් පනස් පන් දහස් එකසිය පහළොවක) මුදලක් ගෙවීම.

6. යලි සේවයේ පිහිටුවීමේදී තනතුර පහත හෙලන ලද නමුත් වැටුපෙහි හා දීමනාවල වෙනසක් සිදු නොකිරීම.

7. පැමිණිලිකරු වෙත 2021 වර්ෂයට අදාළව අසනීප නිවාඩු සඳහා වන දීමනා ගෙවා තිබීම.

8. නියමිත පරිදි ගණන් බලනු ලැබූ දිරිදීමනා ලෙස රු. 56,333/- (රුපියල් පනස් හය දහස් තුන්සිය තිස් තුනක) මුදලක් පැමිණිලිකරුට ගෙවීම.

9. පැමිණිලිකරු සම්බන්ධව අසාධාරණ හා අයුක්ති සහගත ප්‍රතිපත්තියක් අනුගමනය නොකිරීම හා ආයතනයේ පැවැත්වූ විනය ක්‍රියාමාර්ගවලට යටත්ව කටයුතු කර තිබීම කළමනාකාරීත්වය ආයතනයේ පැවති ක්‍රමවේදයන් මත පිහිටා විධිමත් විනය පරීක්ෂණවල නිර්දේශ සලකා බලා කටයුතු කිරීම.

මෙම නඩුකරයේදී පහත සඳහන් ගැටලු කෙරෙහි ගරු බේරුම්කරණ අධිකරණයෙහි අවධානය යොමු වී ඇත.

1. සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම තුළ 2021.03.05 දින සිදුවූ වැඩ වර්ජනය හෝ විරෝධතාව හුදෙක්ම පැමිණිලිකරුගේ මෙහෙයවීමෙන් පමණක් සිදු වූවක්ද?

2. පැමිණිලිකරුට එරෙහිව ලබා දී ඇති විනය නියෝගය සර්ව සාධාරණත්වය හා ස්වාභාව යුක්තියේ මූලධර්මයට අනුකූලව සිදුකොට ඇත් ද?

3. ස්වාධීන විනය පරීක්ෂණය වාර්තාව දෙවන පාර්ශ්වය විසින් මෙම නඩුකරයට ගොනු කර ඇත් ද?

4. විනය නියෝගයෙන් තනතුර පහත හෙලූ පැමිණිලිකරුට යලි රාජකාරි පැවරීම නව තනතුරට අදාළව නිසියාකරව සිදුවී ඇත් ද?

5. සේවක අයිතිවාසිකමක් වන වෘත්තිය සමිති කටයුතුවල යෙදීමේ අයිතිය දෙවන පාර්ශ්වය විසින් අහිමි කොට තිබේද?

6. පැමිණිලිකරු විසින් ගරු බේරුම්කරණ අධිකරණය තුළින් ඉල්ලා ඇති සහන සාධාරණ හා යුක්ති සහගත ඉල්ලීමක් වන්නේ ද?

මෙම විසඳිය යුතු ගැටළු පිළිබඳව ගරු බේරුම්කරණ අධිකරණය පහත සඳහන් කරුණු නිරීක්ෂණය කෙරේ.

1. පරීක්ෂණ ක්‍රියාවලියේදී පැමිණිලිකරුගේ ස්ථාවරය ඔහුගේ මෙහෙයවීමෙන් තොරව මෙම වැඩ වර්ජනය හෝ සේවක විරෝධතාව සිදුවී ඇති බවය. මේ පිළිබඳව ආයතනයේ ස්ථාවරය පූර්ව දැනුම්දීමකින් තොරව වැඩ වර්ජනයට හෝ සේවක විරෝධතාවයට පැමිණිලිකරු කටයුතු කර ඇති බව වේ. සංශෝධන චෝදනා පත්‍රයෙහි පළමු චෝදනාවේ හරය වන්නේ වැඩ වර්ජනය හෝ සේවක විරෝධතාවයක් මගින් වැඩ නැවැත්වීමක් සිදු කිරීමට පෙර යටත් පිරිසෙන් දින 21කට පෙර තමන්ගේ සේවා යෝජකයාට අදාළ කාරණය ලියවිල්ලක් මගින් දැනුම්දීමට කටයුතු නොකිරීමෙන් සංශෝධිත 1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනතේ V වන කාණ්ඩයෙහි 32(2) වගන්ති ප්‍රකාරව වරදක් සිදුකර ඇති බවය.

කෙසේ වුවත් 2021.04.06 දිනැති චෝදනා පත්‍රය ආරම්භයේදීම සඳහන් වන්නේ විදුලි අංශයේ විදුලි වැඩ මූලිකවරයෙකු ලෙස සේවය කරමින් සිටියදී යනුවෙනි. ඒ අනුව පැමිණිලිකරු වෘත්තීය සමිති නායකයකු හෝ එහි ක්‍රියාකාරිකයෙකු බවට ආයතනය පවා පිළිගෙන නැත. විදුලි විසන්ධිකිරීමේ කඩා කප්පල්කාරී සිදුවීමක් වූවා නම් ඒ පිළිබඳව වහාම පොලිසියට පැමිණිලි කොට නීත්‍යානුකූලව කටයුතු කිරීමේ හැකියාව ආයතනය සතු වුවත් එවැන්නක් සිදුවූ බව වාර්තා වී නැත. පැමිණිලිකරුට අමතරව මෙම ක්‍රියාවලියට සම්බන්ධ වූ බොහෝ දෙනෙක් සිටියත් ඔවුන් සම්බන්ධවද විනයානුකූලව කටයුතු නොකිරීම බේරුම්කරණ අධිකරණය විශේෂ සැලකිල්ලට භාජනය කෙරේ.

2. මූලික සාක්ෂි විභාගයේදී පැමිණිලිකරු සමග තවත් 18 දෙනෙකු වැඩ තහනමට පත්ව ඇත. පැමිණිලිකරුගේ සේවය මාස 14 පමණ කාලයක් අත්හිටුවා ඇතත්, අනෙකුත් පුද්ගලයන්ගේ සේවය අත්හිටුවා තිබුණේ මාස 02ක් පමණ වූ කාලයකට බව සාක්ෂි විභාගයේදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (මානව සම්පත්) පිළිගෙන ඇත. පැමිණිලිකරු හැර අනෙකුත් චූදිතයන් විනය පරීක්ෂණයට භාජනය නොකිරීමත්, විනය දඬුවම් නොමැති වීමත් ගරු බේරුම්කරණ අධිකරණය සැලකිල්ලට භාජනය කෙරේ.

3. 2021.03.05 වන දින විදුලි අංශය වෙත විදුලි වැඩ මූලික තනතුර වෙනුවෙන් වෙනත් සේවකයෙක් බඳවා ගැනීමේ පටිපාටියෙන් බැහැර ක්‍රියාපටිපාටියක් අනුගමනය කර බඳවා ගැනීම තුළ සේවක උද්ඝෝෂණ ඇති වූ බවද වාර්තා වේ. පැමිණිලිකරු පිළිබඳ වූ චෝදනා පත්‍රය හා විනය නියෝගය මෙම අධිකරණය වෙත ඉදිරිපත් කොට තිබුණත් විනය පරීක්ෂණ වාර්තාව ඉදිරිපත් නොකිරීම ඇතැම් කරුණු බැහැර කිරීමත් වශයෙන්ද සැලකීමට සිදුවේ.

4. විධිමත් විනය පරීක්ෂණයක් අවසන් වාර්තාව අනුව කිසිදු පූර්ව දැන්වීමක් නොකර වැඩ වර්ජනයකට හෝ සේවක විරෝධතාවයකට යොමු කරවීම, සමස්ථ ආයතනයේ විදුලිය විසන්ධි කර තිබියදී නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්මාන්ත ශාලා විසින් ලබා දෙන ලද නීත්‍යානුකූල උපදෙස් අනුව කටයුතු නොකිරීම, නීත්‍යානුකූල නොවූ නියෝගයක් ලබා දීම. අදාළ දින සේවක විරෝධතාවය ආරම්භ කර ආයතනයේ විදුලිය විසන්ධි කර ආයතනයට බරපතල හානියක් සිදුවන ආකාරයට කටයුතු කිරීම, පැමිණිලිකරු වෙත ලබාදී ඇති රාජකාරී ලැයිස්තුවේ උපදෙස්වලට පටහැනිව කටයුතු කිරීම, අදාළ දින විදුලිය විසන්ධි කර සමාගමේ සම්පත් විනාශවීමට හෝ වටිනාකම් අඩුවීමට ඉඩහැරීම යන විෂමාචාර ක්‍රියාවන් සිදුකළ බවට විමර්ශනය තුළින් ඔප්පු වී ඇත. යනුවෙන් දෙවන පාර්ශ්වය ලිඛිත දේශනවල කරුණු පෙන්වා දී ඇත.

කෙසේ වෙතත් විනය නියෝගයෙන් පසු තනතුර පහත හෙලූ පැමිණිලිකරුට මුලින් ඉටුකළ රාජකාරීම ලබා දී ඇත බවද, ඒ ආකාරයෙන්ම වගකීම් පවරා ඇති බවද, බේරුම්කරණ අධිකරණය නිරීක්ෂණය කෙරේ. රාජකාරී ලැයිස්තු අධ්‍යනයේදී පැමිණිලිකරුගේ අධීක්ෂණ නිලධාරී වශයෙන් විදුලි ඉංජිනේරුවරයෙකු කටයුතු කරන බව පෙනේ. එබැවින් විදුලිය බිඳවැටීමකදී ඔහුගේ කාර්යභාරයද ප්‍රශ්න ගත වේ.

5. ආයතනය තුළ 2021.03.05 දින සිදුවීම වැඩ වර්ජනයක් හෝ සේවක විරෝධතාවකට යොමු කරවීම අසම්භාව්‍ය ප්‍රකාශයකි. එහි වගකිව යුතු පාර්ශවයන් නිශ්චිතවම පැහැදිලි නොවේ. එබැවින් වෘත්තීය සමිති ක්‍රියාකාරකම් කටයුතුවල යෙදීමේ අයිතිය අහිමි කොට ඇති බව ගම්‍ය නොවේ.

6. පැමිණිලිකරු 2024.05.13 දිනැතිව ආරවුලට හේතු වී ඇති සම්පූර්ණ විස්තරය හා මූල්‍ය ප්‍රකාශයක් ඉදිරිපත් කොට තිබේ. 2021 මාර්තු සිට 2022 අප්‍රේල් දක්වා එම මූල්‍ය ප්‍රකාශයට පහත සඳහන් දෑ ඇතුළත් වේ.

- ✓ මූලික වැටුප එකතුව රු. 403,130.00
- ✓ ජීවන වියදම් දීමනාව එකතුව රු. 90,200.00
- ✓ අන්තර් දීමනාව එකතුව රු. 140,000.00
- ✓ අයවැය සහන දීමනා එකතුව රු. 38,500.00

  මීට අමතරව වර්ෂ 03ක වැටුප් වර්ධක විලම්භනය කිරීම නිසා අහිමිවූ මුදල රු. 4,860.00

මෙම මූල්‍ය වාර්තාව පිළිබඳව දෙවන පාර්ශ්වය හෙවත් වග උත්තරකාර ආයතනය විරෝධතාවයක් දක්වා නැත.

තීන්දු ප්‍රකාශය

සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගමෙහි සේවය කරන ඒ.එම්.එස්.එම්.පී.එස්. අත්තනායක මහතා 2021.03.05 දින වැඩ තහනම් කර පසුව 2022.05.03 වන දින නැවත සේවයේ පිහිටුවීමේදී,

I. වැඩ මූලික තනතුර ජෝෂ්ඨ විදුලි කාර්මික ලෙස පහත හෙලීම.
II. 2022,2023,2024 වැටුප් වර්ධක විලම්භනය කිරීම.
III. වැඩ තහනමට ලක්වූ කාලය සඳහා වැටුප් නොගෙවීම.
IV. අභ්‍යාන්තර ස්ථාන මාරුවක් සිදු කිරීම.
V. ආයතනය විසින් පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයේදී අවසන් වාර්තාව ලබා නොදීම.

යන කරුණු මගින් පැමිණිලිකරුට අසාධාරණයක් සිදුව ඇති බවට මෙම බේරුම්කරණ අධිකරණය තීරණය කරමි. ඒ අනුව,

1. පැමිණිලිකරු 2021.03.05 දින සිට වැඩ මූලික තනතුරෙහි පිහිටුවිය යුතුය.
2. 2022,2023,2024 වර්ෂවල විලම්භනය කල වැටුප් වර්ධක යළි ලබාදිය යුතුය.
3. වැඩ තහනමට ලක්කළ කාලය සඳහා වැටුප් ගෙවිය යුතුය.
4. අභ්‍යාන්තර ස්ථාන මාරුව අවලංගු කළ යුතුය.
5. ආයතනය විසින් පවත්වනු ලැබූ විධිමත් විනය පරීක්ෂණයේදී අවසන් වාර්තාව ලබා නොදීම.

පැමිණිලිකරුට සිදුවූ මූල්‍ය අලාභ වශයෙන් රු.676,690.00 ක (රුපියල් හය ලක්ෂ හැත්තෑ හය දහස් හයසිය අනූවක) මුදලක් ගෙවීමට කටයුතු කළ යුතු බවට වැඩි දුරටත් තීරණය කරමි.

මෙම තීරණය ක්‍රියාත්මක කර ප්‍රගතිය දෙවන පාර්ශ්වය හෙවත් සී/ස ලංකා සීනි (පෞද්ගලික) සමාගම විසින් මෙම තීරණය ගැසට් පත්‍රයේ පළවී මාස 03ක් ඇතුළත මොනරාගල සහකාර කම්කරු කොමසාරිස් වෙත වාර්තා කළ යුතුය.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට සඳහන් කරමි. ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම තීරණය බාධාවක් නොවිය යුතුය.

**ආචාර්ය කේ.ඒ. තිලකරත්න,**
බේරුම්කරු.

2025 නොවැම්බර් මස 20 වැනි දින,
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේදී ය.

EOG 01-0194

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.